වාර්ෂික වාර්තාව- 2016

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

පටුන

අන්තර්ගතය	පිටු අං
විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ ඓතිහාසික පසුබිම	03
ආයතනික තොරතුරු	04-05
ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන සභාපතිවරයාගේ ලිපිය	06
මානව සම්පත් සංවර්ධනය	07
රෝහල් සේවා විශ්ලේෂණය	08-15
2015 වසරේ ප්‍රධාන සාධනයන්	16
2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය , මූල්‍ය කාර්‍ය සාධන ප්‍රකාශනය	17-32
විගනකාධිපතිවරයාගේ සහතිකය හා විගනකාධිපති වාර්තාව (1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14 (2) c වගන්තිය ප්‍රකාරව)	33-47

දැක්ම

අනාගිතම සෞඛ්‍යාරක්ෂාවක් හා ආදර්ශ රෝහලක ආදර්ශය සැපයීම

මෙහෙවර

ප්‍රදේශයේ හා රටේ ජනයාගේ සෞඛ්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා පහසුකම් හා සේවක මඩුල්ල ඇපකැපව හා කාර්යක්ෂමව භාවිතා කිරීම. අක්ෂි රෝග, දියවැඩියාව හා තුවාල සුව කිරීම යන ක්ෂේත්‍ර වල රාජ්‍ය තලයේ සෞඛ්‍ය තත්වයක් සැපයීම පිණිස රෝහලේ දැනට ඇති පහසුකම් දිගුකාලීනව වැඩිදියුණු කිරීම

සාමූහික අභිමතාර්ථයන්

රෝහලේ අරමුණ වන්නේ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණෙන පොදු ජනයාට කිසිදු පංති භේදයකින් තොරව අක්ෂි ප්‍රතිකාර, ශල්‍යාමය හා දියවැඩියා කළමනාකරණය උසස් අන්දමින් සිදු කරමින් කාර්යක්ෂම සෞඛ්‍ය සේවා සැපයීම.

විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ 2016 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය

2016 ජනවාරි 01 සිට 2016 දෙසැම්බර් 31 දක්වා

ඓතිහාසික පසුබිම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1998 අංක 31 දරණ විජය කුමාරතුංග අනුස්මරන පදනම ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කර ඇත.

විජය කුමාරතුංග අනුස්මරන රෝහල 1988 පෙබරවාරි 16 වන දින ඝාතනය කළ විජය කුමාරතුංග මහතා සිහිවීම පිණිස පිහිටුවිනි. එවකට ජනාධිපති අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ මුල් ගම වන සීදුව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් රෝහලක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය දියත් කෙරිනි.

මෙම රෝහල ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක-සීදුව නගර සභා සීමාව තුල කොළඹ-මීගමුව ප්‍රධාන මාර්ගයේ සීදුවේ පිහිටි අක්කර තුනක ඉඩමක් විජය කුමාරතුංග අනුස්මරන පදනම මගින් ඉදි කෙරිනි. ආරම්භයේ දී රෝහල වාට්ටු දෙකින් (ඇඳන් 60) ක් හා බාහිර රෝගී අංශයක් සහිත වූ අතර සීදුවේ ජනයාට විශේෂයෙන්ම මූලික සෞඛ්‍යාරක්ෂණ ඒකකයක් බවට පත් විය. එවකට ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ උපන් දිනය වන 1999 ඔක්තෝබර් 09 දින රෝහල නිල වශයෙන් විවෘත කරන ලදී. රෝහලේ කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් දරණ අතර, අරමුදලේ ප්‍රධාන අරමුදල් ප්‍රවාහය සිදු කරනුයේ රජය මගිනි. අද වන විට රෝහල මගින් අක්ෂි ප්‍රතිකාර සේවා මෙන්ම වෙනත් තෘතීමය ප්‍රතිකාර ලබා දෙමින් විශාල ජනතාවකට සේවය සළසයි.

විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති තීරණ ගනු ලබන අතර එහි මෙහෙයුම් හා එදිනෙදා කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1998 අංක 31 දරණ විජය කුමාරතුංග අනුස්මරන පදනම ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් සිදු කෙරේ. විජය කුමාරතුංග අනුස්මරන රෝහල ප්‍රතිපත්තියක් ලෙස ලාභ තකා පිහිටවූ එකක් නොවනවා වුවද ඊට ආවේනික ශාස්තු ක්‍රමයක් ඇත. මෙහිදී ශෛල්‍යකර්ම සහ වැඩිදුර පරීක්ෂණ වැනි තෝරාගත් ක්ෂේත්‍ර තුල අයකිරීම් සිදු කරනුයේ පිරිවැය ආවරනය කර ගැනීම සඳහා පමණි. එසේ වුවද, අව වරප්‍රසාදිත ජනයාගෙන් මෙම සාධාරණ අයකිරීම් වුවද අය නොකෙරේ.

වැඩිදියුණු කිරීම් වල කොටසක් ලෙස, 2004 දි මූලිකව ඇරඹී සමස්ත ඇඳන් ප්‍රමාණය 148 ක් බවට පත් කරමින් ඇඳන් 88 කින් සමන්විත අක්ෂි වාට්ටුවක් සහිත වෙනම ගොඩනැගිල්ලක් තැනීම දියත් කර ඇත. ඒ අතර ජනයාට උසස් ප්‍රමිතියකින් යුතු සේවාවක් ලබා දීමේ අරමුණින් පවත්නා ප්‍රමිතීන් වැඩිදියුණු කර ශල්‍යාගාරයක් සහිතව පූර්ණ පහසුකම් වලින් යුතු අක්ෂි වාට්ටුවක් 2007 වසරේ දී අරඹන ලදී.

2012 වසරේ දී වර්ග අඩි 4,061 කින් යුත් වෙනම දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවසන් කර ඇති අතර එය සාමාන්‍ය ගබඩා, වෛද්‍ය වාර්තා ගබඩාව, රාජකාරී කාමර හා සම්මන්ත්‍රණ ශාලාවක් වැනි අංග වලින් සමන්විත වේ.

වර්ග අඩි 4386 ක බිම් ප්‍රදේශයක් සහිත තෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම 2015 වසරේ දි අවසන් කර ගැනීමට හැකි විය. එතුල රසායනාගාරය, තුවාල ප්‍රතිකාර ඒකකය, උපයෝගීතා කාමර වැනි පහසුකම් වැඩිදුර සැපයීම සිදු විය. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (NERD) උපදෙස් මත රු. මිලියන 12.431 ක වියදමක් සහිතව තැනූ මෙම ගොඩනැගිල්ල 2015 සිට භාවිතා කෙරේ.
2016 වසර තුල **ශල්‍ය** ඒකකය පිහිටුවනු ලැබූ අතර **ශල්‍ය** වාට්ටුව රසායනාගාර ගොඩනැගිල්ලේ බිම් මහලේ ආරම්භ විනි. එන්ඩොස්කොපි යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම මගින් **ශල්‍ය** ඒකකයේ 2016 වසර තුල රෝගී ප්‍රතිකාර සේවාලබා දීම පුළුල් කෙරිනි.

වර්තමානය වන විට වාට්ටු 6 ක් සහ මුලු ඇඳන් ප්‍රමාණය 166 ක් ව පවතී

ආයතනික තොරතුරු
01-01-2016 ~ 31-12-2016

ආයතනයේ නම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල

ලිපිනය

විජයකුමාරතුංග අනුස්මරන රෝහල, සීදූව

කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්

නෛතික ව්‍යුහය

1999 අංක 38 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවා ඇත.

විගනකවරු

- විගනකාධිපති, විගනකාධිපති දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල
- අභ්‍යන්තර විගණන ඒකකය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
  385, පූජ්‍ය බද්දේගම විමලවංශ මාවත,
  "සුවසිරිපාය"
  කොළඹ 10

අධ්‍යක්ෂ මණ්ඩලය
01-01-2016 ~ 31-12-2016

සභාපති

මහා. කාලෝ පොන්සේකා

අධ්‍යක්ෂ මණ්ඩලය

- වෛද්‍ය පාලිත මහීපාල, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
- එන්.ඒ. උමගිලිය මයා, වෘත්තීය නියෝජිත
- වෛද්‍ය පී.එස්. ජයලත් මිය, රෝහල් නියෝජිත
- වෛද්‍ය විමුක්ති කුමාරතුංග, විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පදනමේ සාමාජික (චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ නියෝජිත)
- ඩබ්.එච්.ජී. ගයාන් කෝසල මයා **භාණ්ඩාගාර නියෝජිත**
- චන්ද්‍රා වික්‍රමසිංහ මයා

විගණන කමිටුව

01-01-2016 ~ 31-12-2016

සභාපති

ඩබ්.එච්.ජී. ගයාන් කෝසල මයා, **සහකාර අධ්‍යක්ෂ , කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව**

නිරීක්ෂක

එස්.ආර්. **බී.ප්‍රන්නාදු මිය,** ප්‍රධාන **අභ්‍යන්තර විගණක,** සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශය

ආර්.එම්.කේ.කල්‍යාණි මිය, ගිණුම් අධිකාරි, විගනකාධිපති දෙපාර්තමේන්තුව

සාමාජික

වෛද්‍ය පී.එස්. ජයලත් මිය, **කාර්‍ය භාර වෛද්‍ය නිලධාරී , වි.කු.අ.රෝ.**

සහභාගීත්වය – K.M.Y.K. කරුණාරත්න මිය,**ගණකාධිකාරී , වි.කු.අ.රෝ.**

බැංකුකරුවෝ

ලංකා බැංකුව, සීදූව

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
385, බද්දේගම විමලවංශ නාහිමි මාවත
"සුවසිරිපාය",
කොළඹ 10.

<u>2016 වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව</u>

1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14 (2) වගන්තිය අනුව, විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ පාලක මණ්ඩලය වෙනුවෙන් මම 2016 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

මහා. කාලෝ ෆොන්සේකා,
සභාපති,
විජය කුමාරතුංග අනුස්මරන රෝහල,
සීදූව.

පිටපත : ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

2016 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල වාර්තාව

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය
අධ්‍යක්ෂ	1	0
නිර්වින්දන වෛද්‍ය විශේෂඥ	1	1
කායික රෝග විශේෂඥ වෛද්‍ය	2	1
ශල්‍ය වෛද්‍ය විශේෂඥ	1	1
අන්තරාසර්ග වෛද්‍ය විශේෂඥ	1	0
අක්ෂි ශල්‍ය වෛද්‍ය විශේෂඥ	2	1
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	1	1
වෛද්‍ය නිලධාරී	26	22
දන්ත ශල්‍ය වෛද්‍ය	2	1
අභ්‍යන්තර විගණක	1	0
ගණකාධිකාරී	1	1
ලියාපදිංචි වෛද්‍ය නිලධාරී	2	3
විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනී	1	1
හෙද සොයුරී	2	1
හෙද නිලධාරී	81	72
පරිපාලන නිලධාරී	1	1
ඖෂධවේදී	6	5
විකිරණශිල්පී	2	1
වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ	5	3
අක්ෂි තාක්ෂණවේදී	4	4
පෝෂණවේදී	1	0
වැඩ මූලික	1	0
වායු සමීකරණ කාර්මික ශිල්පී	1	0
විද්‍යුත් බන්තු රේඛණ ශිල්පී	1	0
කළමණාකරණ සහකාර	7	7
ඖෂධ සංයෝජක	3	3
ගබඩා භාරකරු	1	1
පොත් තබන්නා	1	1
යතුරු ලියන්නා (සිංහල / ඉංග්‍රීසි)	2	0
ආහර නිරීක්ෂිකා	1	1
නිවාස භාරකාරිනී	1	0
වෛද්‍ය ලේඛණාගාර සහකාර	1	1
රියදුරු	4	3
විදුලි කාර්මික	1	1
නඩත්තු කම්කරු	3	3
Lab Orderly	2	0
අරක්කැමි	3	2
දුරකථන ක්‍රියාකාරු /පිලිගැනීමේ නිලධාරිනී	3	0
සෞඛ්‍ය කාර්ය සහයක	69	68
Total	**249**	**211**

රෝහල මගින් ලබා දෙන සේවා

හැඳින්වීම

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල මගින් බාහිර ප්‍රතිකාර සේවා හා අභ්‍යන්තර ප්‍රතිකාර සේවා යන දෙවර්ගයම ලබා දේ. බාහිර රෝගී දෙපාර්තමේන්තුව (OPD), හදිසි ප්‍රතිකාර ඒකකය (ETU), එන්ඩොස්කොපි ඒකකය හා විශේෂිත සායන මගින් බාහිර ප්‍රතිකාර සේවා සළසා දේ. වෛද්‍ය, සැත්කම්, අක්ෂි හා තුවාල සත්කාරක වාට්ටු හා ශල්‍යාගාර මගින් අභ්‍යන්තර සේවා සළසා දේ. 2016 වසරේ වාට්ටුගත ව ප්‍රතිකාර ලබා ගත් ප්‍රමාණය 75.12% ක් විය.

රෝගී ප්‍රතිකාර සේවා සඳහා රෝහලේ පිහිටි බෙහෙත්ශාලාව, එක්ස් කිරණ ඒකකය, වෛද්‍ය රසායනාගාරය හා ඊසීජී ඒකකය ඉවහල් වේ. විශේෂිත නොවන මෙන්ම විශේෂිත සේවා රෝහල මගින් මහජනයාට ලබා දේ. රෝහලේ දැනට ඇති පහසුකම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ බී වර්ගයේ මූලික රෝහලක ඇති පහසුකම් වලට සමානවේ.

අභ්‍යන්තර කළමනාකරනය අවශ්‍ය වන වෛද්‍ය, සැත්කම් හා අක්ෂිමය සංකූලතා සහිත රෝගින් බාහිර රෝගි අංශය, හදිසි ප්‍රතිකාර ඒකකය හා විශේෂිත සායන වලින් වාට්ටු වලට ඇතුළත් කෙරේ. MRI, CT ස්කෑන් වැනි විශේෂ පරික්ෂණ අවශ්‍යවන රෝගින්ව ජාතික රෝහල, රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහලට හා පුද්ගලික රෝහල් වලට යොමු කෙරේ.

○ **<u>බාහිර රෝගී දෙපාර්තමේන්තුව (OPD)</u>**

රෝහලේ බාහිර රෝගී දෙපාර්තමේන්තුවට පැමිණෙන රෝගීන්ගෙන් වැඩි දෙනෙකු පැමිණෙන්නේ කඳාන, ජා ඇල හා කටුනායක වැනි ප්‍රදේශ වලිනි. කටුනායක අපනයන සැකසුම් කලාපයේ කාර්ය මණ්ඩල ද ඒ අතර වේ. ඊට අමතරව,මිනුවන්ගොඩ හා ගම්පහ ප්‍රදේශ වලින්ද ප්‍රතිකාර තකා රෝගීන් මෙම රෝහලට පැමිණේ.

2016 වසර තුල බාහිර රෝගීදෙපාර්තමේන්තුවේ ප්‍රතිකාර ලැබූ මුළු සංඛ්‍යාව 131,953ක් වූ අතර දිනක සාමාන්‍යය රෝගීන් **361** ක් විය. බාහිර රෝගී දෙපාර්තමේන්තුවේ ප්‍රමාණවත් වෛද්‍යවරුන් නොමැතිවීම මෙම වසරේ එම දෙපාරේතමේන්තුව තුල ඇති අඩුපාඩු වලින් එකකි.

1 වන වගුව මගින් බාහිර රෝගී දෙපාර්තමේන්තුව සම්බන්ධන පසුගිය වසර තුල තත්වය විදහා දක්වේ.

○ **<u>හදිසි ප්‍රතිකාර ඒකකය (ETU)</u>**

පැය විසිහතර පුරා විවෘතව ඇති හදිසි ප්‍රතිකාර ඒකකය මගින් රෝහලට ගෙන එන හදිසි ප්‍රතිකාර සියල්ලට සත්කාර සැලසේ. මාර්ග අනතුරු, කාර්මික අනතුරු හා අපනයන සැකසුම් කලාපයේ ඇති වන කර්මාන්තශාලා අනතුරු හා ගෘහස්ත හදිසි අනතුරු වලින් පීඩාවට ලක්වන්නන් හදිසි ප්‍රතිකාර ඒකකයට රැගෙන එනු ලැබේ. දරුණු හදිසි අනතුරු වලට ප්‍රතිකාර කරන අතර විශේෂිත සත්කාර අවශ්‍ය වන රෝගීන් අදාල වාට්ටු වෙත යොමු කෙරේ. වෛද්‍ය, සැත්කම් හා අක්ෂිමය ප්‍රතිකාර අවශ්‍ය කරන රෝගීන් විශේෂිත ප්‍රතිකාර සඳහා ආසන්නයේ ඇති රෝහල් වෙතට යොමු කෙරේ. විශේෂ වෛද්‍යවරයෙකු මෙම ඒකකය තුල සිටින බැවින් වෛද්‍ය වාට්ටුවලට යැවීමට පෙර දින ගණනාවක් දැඩි සත්කාර අවශ්‍ය කරන රෝගින් ප්‍රතිකාර ලබා දේ.

උදාහරණයක් ලෙස,හදවත් ආබාධ/ කිරීට සින්ඩ්‍රෝම් හා මාරාන්තික සිටින නියුමෝනියා රෝගීන් රෝහලේ H.D.U නොමැති බැවින් පරීක්ෂා කිරීම් සඳහා හදිසි ප්‍රතිකාර ඒකකයේ තබා ගැනේ.

හදිසි ප්‍රතිකාර ඒකකයෙන් 2016 වසර තුල ප්‍රතිකාර ගත් මුළු රෝගී සංඛ්‍යාව 20,901ක් විය.හදිසි ගත වූවසර 5 ට අදාළව ප්‍රතිකාර ඒකකයේ සංඛ්‍යාලේඛන 1 වගුව තුල දක්වා ඇත.

- ## දන්ත ඒකකය

දන්ත ඒකකය සඳුදා සිට සෙනසුරාදා දක්වා රෝගීන් සඳහා විවෘතව තැබේ. සෙනසුරාදා දිනවල පාසැල් සිසුන් සඳහා ප්‍රමුඛත්වය ලබා දේ.

සාමාන්‍ය දන්ත ප්‍රතිකාර, දත් ගැලවීම්, පිරවීම් සහ කම්පනය, කාලීන ප්‍රතිකාර, පීඩොඩොන්ටික් ප්‍රතිකාර, සුළු සැත්කම් කටයුතු වැනි හදිසි දන්තා ආබාධ සායන තුලදී සිදු කෙරේ. මීට අමතරව, ප්‍රතිසංස්කරණ හා ඉදිරියට නෙරා ඇති දත් සැකසීම ද සිදු කෙරේ.

මුයුකොසන් සියැටිස් ඉවත් කිරීම, පළුදු වූ 3 වන මොලර් ඉවත් කිරීම සහ කැනීස් දන්ත සායනය තුල සිදු කරන සිළු සැත්කම් අතර කිහිපයකි.

2016 වසර තුලදී දන්ත ඒකකයට පැමිණි සමස්ත රෝගී සංඛ්‍යාව 8057 ක් විය. ගත වූ වසර 5 තුල දන්ත ඒකකයේ සංඛ්‍යාලේඛන 1 වගුව තුල දක්වා ඇත.

- ## වෛද්‍ය ඒකකය

ඇඳන් 25 කින් යුතු පිරිමි වාට්ටුවක් හා ඇඳන් 30 කින් යුත් කාන්තා වාට්ටුවක් වෛද්‍ය ඒකකය සතුව ඇත. වෛද්‍ය ඒකකය සඳුදා සිට සෙනසුරාදා දක්වා සායන පවත්වනු ලැබේ. දියවැඩියාව,අධ්‍යාතතිය, ඇදුම වැලදී ඇති රෝගීන්හටද මෙම සායනයේදී ප්‍රතිකාර ලබා දේ.

2016 වසර තුල මෙම වෛද්‍ය සායනයෙන් සේවා ලබාගත් මුළු රෝගී සංඛ්‍යාව 43,282 ක් විය. ගතවූ පස් වසර තුල වෛද්‍ය සායනය, වාට්ටු අංක 1 හා 2 ට සම්බන්ධන සංඛ්‍යාලේඛන 2 වන වගුව තුල දක්වා ඇත.

- ## Visiting clinic ජංගම සායන පැවැත්වීම

රෝහලේ බාහිරවිශේෂඥ වෛද්‍යවරුන් විසින් පවත්වන සායන දෙකක් විශේෂිත ළමා සායනය, දියවැඩියා හා අධික රුධිර පීඩන සායනය සතිපතා පැවැත්විනි. 2016 වසර තුල දියවැඩියා හා අධික රුධිර පීඩන සායනය සඳහා මුළු රෝගී සංඛ්‍යාවපිළිවෙලින් **1295** හා **2346** ක් විය.

ගත වූ වසර පහ තුල බාහිර සායන වල දත්ත 3 වන වගුව තුල දැක්වේ.

- ## වෙනත් සායන

මීට අමතරව,මානසික රෝග සායනය, බෝ නොවන රෝග(NCD) සායනය හා ප්‍රසව හා පවුල් සංවිධාන සායනය සතිපතා ශ්‍රේනිගත වෛද්‍ය නිලධාරීන් විසින් සිදු කෙරිනි. මානසික රෝග හා බෝ නොවන රෝගසායන මගින්2016 තුලදී පිළිවෙලින් රෝගීන් **2056** කට හා **566** දෙනෙකුට ප්‍රතිකාර ලබා දී ඇත. ගත වූ වසර පහ තුල වෙනත් සායන වල දත්ත 4 වන වගුව තුල දැක්වේ.

- ## ශල්‍ය ඒකකය

2016 මැද භාගයේ ඇඳන් 6 කින් යුතු වාට්ටුවක් හා සැත්කම් සායනය සහිතව ශල්‍ය ඒකකය ස්ථාපිත කෙරිනි. එන්ඩොස්කොපි ඒකකය 2016 අවසාන භාගයේ දී ආරම්භ කෙරිනි.

2016 වසර තුල ශල්‍ය සායනයට සහභාගී වූ මුළු සංඛ්‍යාව2415ක් වූ අතරසිදු කළ ශල්‍යකර්ම ගණන **477** කි. ගත වූ වසර පහට අදාළ ශල්‍ය ඒකකයේ විස්තර 6 වන වගුව තුල දැක්වේ.

○ <u>තුවාල ප්‍රතිකාර ඒකකය</u>

මෙම රෝහලේ තුවාල ප්‍රතිකාර ඒකකය රටේ ප්‍රමුඛ නමක් දිනා ගැනීමට සමත් වී ඇති අතර රටේ සතර දිග්භාගයේන්ම රෝගීන් මෙම රෝහලට ප්‍රතිකාර ගැනීම් සිදු වෙමින් පවතී. සායනයට අමතරව අභ්‍යන්තර අංශයක් මෙම ඒකකය තුල පවතින බැවින් වෙනත් රෝහල්වල තුවාල බෙහෙත් ගැල්වීමේ සායන වලට වඩා තුවාල ප්‍රතිකාර ඒකකය වෙනස් වේ.

සුළු පරිමාණ සැත්කම් අවශ්‍ය කරන රෝගීන් හා **ස්ථානික** නිර්වින්දනය යටතේ debridementඅවශ්‍ය කරන රෝගීන් හට මෙම ඒකකයෙන් ප්‍රතිකාර කරන අතර ශල්‍යාගාර තුල මහා පරිමාණ සැත්කම් කළයුතු රෝගීන්ව රාගම දිසා මහ ශික්ෂණ රෝහල, මීගමුව දිස්ත්‍රික් මහ රෝහල ට සහ කොළඹ ජාතික මහ රෝහලට යොමු කෙරේ. අවශ්‍ය ක්‍රමවේද වලි්න අනතුරුව මෙම රෝගීන් සාමාන්‍ය පරිදි ඒකකයට වෙත යැවේ.
මෙම ඒකකය මගින් වෛද්‍යවරුන් හා හෙද නිලධාරින් හට පුහුණුවීම් ලබා දේ.

මෙම ඒකකයට සහභාගීවන රෝගී සංඛ්‍යාව 2012 සිට 2-16 දක්වා සීඝ්‍ර වර්ධනයක් ලබා ඇත.
ගත වූ වසර පහ තුල තුවාල සත්කාර ඒකකයේ දත්ත 6 වන වගුව තුල දැක්වේ.

○ <u>අක්ෂි විද්‍යා ඒකකය</u>

අක්ෂි විද්‍යා ඒකකය සතුව අක්ෂි සායනය, අක්ෂි වාට්ටු දෙකක් හා අක්ෂි ශල්‍යාගාරයක් ඇතුළත් වේ. අක්ෂි සැත්කම් ශල්‍යාගාර අක්ෂි සායන ඉරිදා හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල හැර අන් සෑම දිනකයට විවෘතව ඇත. කලින් වේලා වෙන් කරගැනීමක් අවශ්‍ය නොවන අතර පරීක්ෂා කර ගැනීම් කර ගැනීම සඳහා රෝගීන්ට පැමිණිය හැක. රෝගී සීමාවක් පනවා නොමැත. **සායනයට පැමිණෙන සියලු රෝගීන් පරීක්ෂා කරනු ලබයි.** අක්ෂි විද්‍යා ඒකකය මගින් සාමාන්‍ය අක්ෂි සායන, දියවැඩියා හා ග්ලූකෝමා අක්සි සායනය, ළමා අක්ෂි සායනය හා පශ්චාත් සැත්කම් සායන පවත්වා ඇත.

අක්ෂි විද්‍යා ඒකකය තුල Fundus Fluorescein Angiography, නෙරපුම් අංශ ඡායාරූපකරණය, HVF (Humphrey visual field) පරීක්ෂණය, A ස්කෑන් / contact biometry, B ස්කෑන්, OCT (Optical Coherence Tomography) ඩිස්ක් හා මැකියුලා, ටොපෝග්‍රැපි, මූලික ඡායාරූපමය පරීක්ෂණ පහසුකම් සළසා ඇත.
අක්ෂි විද්‍යා ඒකකය තුල හදිසි ප්‍රතිකාර සේවා පැය විසි හතර පුරා පැවැත්වූ අතර අක්ෂි ඒකකය තුල සිදුකළ සැත්කම් වර්ග වලින් කිහිපයකි. තවද, රෝගීන්ට ලේසර් ප්‍රතිකාර ද ලබා දේ.

සිදු කළ සැත්කම් සංඛ්‍යාව වාට්ටුවේ ඇති ඇඳන් සංඛ්‍යාව ඉක්ම වූවද දුර බැහැර පළාත් වලින් පැමිණෙන රෝගීන් වැඩි ප්‍රමාණයක් සැත්කම් කළ දිනම මුදා හැර ඇත.
2016 වසර තුල අක්ෂි ඒකකයේ කාර්යසාධනය පහත දක්වා ඇත.

ක්‍රමවේද වර්ගය	**රෝගීන්** සංඛ්‍යාව
වාට්ටු ඇතුළත් කිරීම්	13,632
සායන සහභාගීත්වය	69,338
සිදුකළ සැත්කම්	10,910
හදිසි අනතුරු ප්‍රතිකාර	2,494
ලබාදුන් ලේසර් ප්‍රතිකාර	1,943
සුදු ඉවත් කිරීම්	12,813
අක්ෂි කඳවුරු වලට සහභාගීවූ රෝගීන්	1,891

ගත වූ පසර පහ තුල සිදු කළ අක්ෂි සායන, අක්ෂි සැත්කම්, ලේසර් ප්‍රතිකාර හා ඇසේ සුද ඉවත් කිරීම් පිළිබඳ සංඛ්‍යාලේඛන 5 වන වගුවේ දක්වා ඇත.

○ සහායක සේවා

○ වෛද්‍ය රසායනාගාරය

වෛද්‍ය රසායනාගාරය සතුව මූලික රසායනාගාර පරීක්ෂා කිරීමේ පහසුකම් ඇත. 2015 වසරේ දී සෙරම් ඉලෙක්ට්‍රොලයිට්ස්, ට්‍රොපොනින් I හා C. ප්‍රතික්‍රියක ප්‍රෝටීන් (CRP-quantitative)සඳහා රසායනාගර පහසුකම් සලසා දී ඇත. වෛද්‍ය රසායනාගාරය තුල MLT වරයෙකු අනුයුක්තව ඇත.
2016 වසරේ සිදු කල රසායනාගාර පරීක්ෂණ මුළු සංඛ්‍යාව 59,178 ක් විය.

○ ECG

තාක්ෂණවේදියෙකු විසින් මෙහෙයවන ඊසීජී (ECG) ඒකකය මගින් බාහිර රෝගීන්ට මෙන්ම නේවාසික රෝගීන්ට ප්‍රතිකාර සැපයේ.

○ එක්ස් කිරණ

එක් විකිරණවේදියෙකුගෙන් සමන්විත එක්ස් කිරණ ඒකකය සියළු වර්ගවල ශාරීරික එක්ස් කිරණ ලබා ගැනීමට පහසුකම් වලින් සමන්විතව ඇත. 2016 වසර තුල ලබා ගත් එක්ස් කිරණ සංඛ්‍යාව **5,478** ක් විය.

ගතවූ පස් වසරේ සහායක සේවා පිළිබඳ සංඛ්‍යාලේඛන 7 වන වගුව තුල දක්වා ඇත'

රෝගී සේවාවන් පිලිබඳ සාරාංශගත විස්තරය

1 වගුව

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2012	2013	2014	2015	2016
බාහිර රෝගී අංශය	131,206	135,796	136,416	138,194	131,953
ශදිසි ප්‍රතිකාර ඒකකය	19,017	18,518	18,651	21,232	20,901
දන්ත ඒකකය	8,313	8,311	8,412	8,234	8,057

2 වගුව
වෛද්‍ය අංශය

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2012	2013	2014	2015	2016
වෛද්‍ය සායනය	22,776	24,862	28,625	34,763	43,282

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2012	2013	2014	2015	2016
WD-1 (Male Ward)	1,211	1,320	1,436	1,659	1,541
WD-2 (Female Ward)	1,402	1,668	1,727	2,028	1,973

3 වගුව
බාහිර විශේෂඥවරුන් පවත්වන සායන

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2012	2013	2014	2015	2016
දියවැඩියා අධිරුධිර පීඩන සායනය	1,358	1,718	2,158	2,689	2,346
ළමා රෝග සායනය	2,089	1,927	1,715	1,355	1,295
මානසික රෝග සායනය	1,795	2,014	2,037	2,252	2,056

4 වගුව
වෙනත් සායන

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2012	2013	2014	2015	2016
බෝ නොවන රෝග සායනය	-	-	-	183	566

5 වගුව
අක්ෂි අංශය

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2012	2013	2014	2015	2016
අක්ෂි සායනය	71,449	65,642	63,983	72,579	49,423
අක්ෂි ශල්‍යකර්ම	8,180	10,247	11,514	11,341	10,910
Laser ප්‍රතිකාර	2,619	2,228	1,900	1,984	1,943
Refractive පරීක්ෂණ		14,462	17,949	17,393	15,193

6 වගුව
ශල්‍ය අංශය

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2012	2013	2014	2015	2016
ශල්‍ය සායනය	1,363	1,145	727	747	2,415
සාමාන්‍ය ශල්‍යකර්ම	150	141	109	109	477
තුවාල සත්කාර ඒකකය		6,069	14,483	23,114	24,221

7 වගුව
සහයක සේවාවන් /පරිපූරක වෛද්‍ය සේවාවන්

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2012	2013	2014	2015	2016
රසායනාගර පරීක්ෂණ	40,231	34,082	47,157	57,138	59,178
එක් රේ පරීක්ෂණ	3,422	3,424	4,535	5,505	5,478
ECG පරීක්ෂණ	2,795	3,005	3,408	3,014	4,303

✓ 2016 වසර තුල රෝගීන්ට වැලඳී ඇති ප්‍රධාන ලද රෝගී තත්වයන් මෙසේය

රෝගය	රෝගීන් සංඛ්‍යාව
Cataract and other disorders of lens	9,819
Essential hypertension (I10)	766
Insulin-dependent diabetes mellitus	733
Other viral diseases(includes viral fever)	702
Non-insulin-dependent diabetes mellitus	696
Other diseases of the eye and adnexa	572
Diarrhoea and gastroenteritis of presumed infectious origin	463
Asthma	430
Infections of skin and subcutaneous tissue	392
Gastritis and duodenitis	283

✓ විශේෂ අවස්ථා

- ✓ වාර්ෂික ලේ දන්දීමේ ව්‍යාපාරය 2016 පෙබරවාරි 16 දින පැවැත්විනි.

➢ ආගමික කටයුතු

- ✓ වෙසක් බන හා පොසොන් දන්සැල පැවැත්වූ අතර නත්තල් සැමරුම් ද සිදු කෙරිනි.

2016 වසරේ ප්‍රධාන සිදුවීම්

2016 වසර තුල පහත දැක්වෙන මිලදී ගැනීම් සිදු කෙරිනි.

A) මිලදී ගැනීම්

1) <u>වෛද්‍ය උපකරණ</u>

Equipment	Quantity	Amount (Rs.)
Multipara Monitors with Cardiac Output	03	1,560,000.00
Ultrasound Scan Machine	01	3,500,000.00
Proctoscope	01	1,578,600.00
YagLaser Unit	01	4,427,500.00
Operating Theatre Overhead Lamp	01	2,448,000.00- item delivered in 2017
Operating Theatre Table	01	4,300,000.00 Item delivered in 2017

2) <u>ලී බඩු සහ සවිකිරීම්</u>

ලී බඩු සඳහා වූ මුලු මුදල රු. 401,199.00ක් විය.

3) <u>යන්ත්‍ර හා විදුලි උපකරණ</u>

යන්ත්‍ර හා විදුලි උපකරණ මිලදී ගැනීම සඳහා වියදම් කළ මුළු මුදල රු. 872,972.50ක් විය

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
මූල්‍ය තත්වය ප්‍රකාශනය
2016 දෙසැම්බර් 31 දිනට

		2016	2015
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් වලට සමාන දෑ	1	24,372,078.77	13,047,074.19
ලැබීමට නියමිත දෑ /උපචිත ලැබීම	2	8,564,929.60	8,965,013.00
තොග	3	18,636,219.19	20,464,464.95
පූර්ව ගෙවීම්	4	265,685.14	319,186.05
		51,838,912.70	42,795,738.19
ප්‍රාග්ධන කාරක ප්‍රගතිය	5	662,076.27	180,000.00
ජංගම නොවන වත්කම්			
යටිතල පහසුකම් , පිරියත හා උපකරණ	6	69,988,186.59	64,265,561.26
ඉඩම් හා ගොඩනැගිලි	7	170,074,857.03	171,238,530.78
		240,063,043.62	235,504,092.04
මුලු වත්කම්		292,564,032.59	278,479,830.23
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවීමට ඇති දෑ	8	17,248,517.69	8,263,979.56
ණය ගැතියෝ	9	42,331,803.89	37,424,718.74
පාරිතෝෂිත ප්‍රතිපාදන	10	22,164,890.64	30,070,612.79
සමස්ථ බැරකම්		81,745,212.22	75,759,311.09
ශුද්ධ වත්කම්		**210,818,820.37**	**202,720,519.14**

Final Account For Annual Report

ශුද්ධ වත්කම් ස්කන්ධය

ප්‍රාග්ධනය	11	75,787,890.44	75,787,890.44
රාජ්‍ය ප්‍රදාන-ප්‍රාග්ධන	12	172,358,655.36	172,698,428.14
පරිත්‍යාග	19	12,221,026.03	1,861,114.53
සංචිත -ප්‍රාග්ධන වාසි		2,131,366.30	2,131,366.30
සමුච්චිත අතිරික්තය-(හිග)	13	(51,680,117.76)	(49,758,280.27)
ශුද්ධ වත්කම්/සම කොටස් එකතුව		210,818,820.37	202,720,519.14
		-	-

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳී සිටින අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩය වෙනුවෙන් අත්සන් කරන ලදී.

....

සභාපති
දිනය

....

අධ්‍යක්ෂ මණ්ඩල
සාමාජික
දිනය

....

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
දිනය

....

ගණකාධිකාරී
දිනය

Final Account For Annual Report

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

2016 දෙසැම්බර් 31 දිනට

		2016	2015
ආදායම			
රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන)		240,000,000.00	209,000,000.00
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය		25,339,772.78	23,024,314.18
වෙනත් ආදායම්	14	22,415,006.86	21,476,057.13
සමස්ත ආදායම		287,754,779.64	253,500,371.31
වියදම්			
කුලී වැටුප් හා සේවක සුභසාධන	15	150,585,999.43	148,331,817.76
සැපයුම් හා භාවිත දෑ	16	79,055,069.76	70,331,120.86
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම	17	25,339,772.78	23,102,515.73
වෙනත් වියදම්	18	35,865,083.56	31,758,803.68
සමස්ත වියදම්		290,845,925.53	273,524,258.03
අතිරික්තය / (හිග) අදාල කාලයේ		**(3,091,145.89)**	**(20,023,886.72)**

Final Account For Annual Report

විජය කුමාරතුංග අනුස්මරන රෝහල - සීදූව

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය - 2016 දෙසැම්බර් 31අවසන් වන වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රවාහ - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්

අතිරික්තය / (හිග)	(3,091,145.89)
මුදල් නොවන මාර්ග	(6,922,437.02)
ක්ෂය	25,339,772.78
ක්‍රමක්ෂය - රාජ්‍ය ප්‍රදාන	(25,339,772.78)
වැඩිවීම - ගෙවීමට ඇති දෑ	8,984,538.13
වැඩිවීම - ණයගැතියෝ	4,907,085.15
වැඩිවීම - තොග	1,828,245.76
අඩුවීම - සේවක පිරිවැයට අදාල ප්‍රතිපාදන	(7,905,722.15)
අඩුවීම - පූර්ව ගෙවීම්	53,500.91
අඩුවීම - ලැබීමට නියමිත දෑ	*400,083.40*
අඩුවීම - පෙර වසරේ ගැලපුම්	689,403.02
විශ්‍රාම පාරිතෝෂිත බැදීම් - ගෙවූ	
ශුද්ධ මුදල් ගලන - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්	(1,056,448.69)
මුදල් ගලන - ආයෝජන ක්‍රියාකාරකම් වලින්	
පිරියත හා උපකරණ මිලදී ගැනීම	(12,116,495.46)
ප්‍රාග්ධන කාරක ප්‍රගතිය	(482,076.27)
ලත් ප්‍රාග්ධන ප්‍රදාන	25,000,000.00
ශුද්ධ මුදල් ගලන - ආයෝජන ක්‍රියාකාරකම්	12,401,428.27
මුදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම් වලින්	
ශුද්ධ මුදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම්	
ශුද්ධ වැඩිවීම / (අඩුවීම) - මුදල් හා මුදල් වලට සමානදෑ	11,344,979.58
මුදල් හා මුදල් වලට සමාන දෑ- කාලාරම්භක	13,027,099.19
මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලාවසාන	**24,372,078.77**

මුදල් ගලන ප්‍රකාශනයේ සටහන් 1

මුදල් හා මුදල් වලට සමාන දෑ

	2016
බැංකුගත මුදල්	24,223,288.77
සුළු මුදල්	139,650.00
අතැති මුදල්	9,140.00
	24,372,078.77

විජය කුමාරතුංග අනුස්මරන රෝහල - සීදූව
ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය
2016 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා

	මහාභාණ්ඩාගාර ප්‍රදාන	රාජ්‍ය ප්‍රදාන ප්‍රාග්ධන	වෙනත් පරිත්‍යාග	වි.කු.අ.රෝ. පදනම	ආයෝජන මණ්ඩලය	UDA	සංචිත-ප්‍රාග්ධන ලාභ(හිග)	ශුද්ධ අතිරික්තය	එකතුව
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	5,112,000	167,586,428	1,861,114	29,632,139	28,155,751	18,000,000	2,131,366	(49,758,280)	202,720,518
වසරේ පරිත්‍යාග			10,359,912						10,359,912
ලත් ප්‍රාග්ධන ප්‍රදාන -වසර තුල		25,000,000							25,000,000
ලත් ප්‍රාග්ධන ප්‍රදාන - ක්‍රමක්ෂය	(1,436,000)	(23,903,773)							(25,339,773)
ශුද්ධ අතිරික්තය/හිගය - කාලය තුල								(3,091,146)	(3,091,146)
ගත වූ වසරේ ගැලපුම්								1,169,308	1,169,308
2016.12.31 දිනට ශේෂය	3,676,000	168,682,655	12,221,026	29,632,139	28,155,751	18,000,000	2,131,366	(51,680,118)	210,818,819

Pg 16

Final Account For Annual Report

සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති

පොදු

සැකසීමේ පදනම

1.1.1 මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව සකසා ඇත.

1.1.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ සකසා ඇත.

1.1.3 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් සකසා ඇත.

රාජ්‍ය ප්‍රදාන

1.2 මණ්ඩලයට රාජ්‍ය ප්‍රදාන වර්ග දෙකකින් ලැබේ. ඒවා නම්
ප්‍රාග්ධන ප්‍රදාන
පුනරාවර්තන ප්‍රදාන

1.2.1 ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව ගණනය කෙරේ. ප්‍රාග්ධන ප්‍රදාන වත්කම්වල භාවිත ආයුකාලය පදනම කරගත් ආදායමක් ලෙස හඳුනාගන්නා විලම්බිත ආදායම් (වාර්ෂිකව ක්ෂයවන වත්කම් වටිනාකම වසරේ ආදායමක් ලෙස ගණන් ගැනේ) ක්‍රමය තුල පිළිගැනේ.

1.2.2 **පුනරාවර්තන** ප්‍රධාන අදාල කාලය තුල ආදායමක් ලෙස හදුනා ගෙන ආදායම් හා වියදම් ප්‍රකාශනයේ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

1.3 **බදු අයකිරීම්**

අදාළ වසර තුල **ඌනතාවයක් ලබා** ඇති හෙයින් මණ්ඩලය බදු සඳහා කිසිදු ප්‍රතිපාදන සැළසීමක් කර නොමැත.

1.4 **සංසන්දනාත්මක තොරතුරු**

මණ්ඩලය නිරතුරව ගිණුම් ප්‍රතිපත්ති අනුව පූර්ව වසර වල අගයන් සලකමින් කටයුතු කර ඇත.

2. **වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම**

2.1 **දේපල, පිරියත හා උපකරණ අගය ක්ෂයවීම් හා ප්‍රතිඇගයුම**

2.1.1 දේපල, පිරියත හා උපකරණ පිරිවැයට හෝ සමුච්චිත ක්ෂය අඩුකර ඇගයුමට දක්වා ඇත. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැය යනු ඒවා ඉදිකිරීම් මිලදී ගැනීමේ පිරිවැය සමඟ වත්කම් අපේක්ෂිත භාවිතාව සඳහා පත් කිරීමට අදාළව කළ අතුරු වියදම් ඇතුළත් වේ.

සේවා ලබා දීමට හැකි වන පරිදි හෝ සේවා ධාරිතාවය වැඩිකරලීම සඳහා ප්‍රාග්ධන වියදම් සිදු කළ ස්ථාවර තත්වයේ යුතු වත්කම් වැඩිදියුණු කිරීම හෝ අත්පත් කර ගැනීම සඳහා කළ වියදම් **මූලධන වියදම් වශයෙන් සලකනු ලැබේ.**

2.1.2 සින්නක්කර ඉඩම් හැර වත්කම් පහත දැක්වෙන අනුපාතයට ඍජු රේඛිය ක්‍රමය භාවිතා කර **පහත සඳහන් ප්‍රමාණයන්ට ක්ෂය වීම් ගණන් බලා ඇත.**

ගොඩනැගිලි හා සවිකිරීම්	2%
වාහන	20%
ලීබඩු, සවිකිරීම් හා උපකරණ	10%
යන්ත්‍රෝපකරණ	15%
වෛද්‍ය උපකරණ	15%
පරිඝණක	20%

2.1.3 මිලදි ගත් වසරට හා මිලදී ගැනීමට අදාලව **ක්ෂය** දක්වා ඇති අතර ඉවත් කිරීමේ වසරේ කිසිදු ක්ෂය දැක්වීමක් කර නොමැත.

2.1.4 මූල්‍ය ගලන ප්‍රකාශය තුල මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස අතැති මුදල් හා බැංකුගත මුදල් ඇතුළත් වේ.

3. **බැරකම් හා ප්‍රතිපාදන**

3.1 ප්‍රාග්ධන බැදීම් හා අවිනිශ්චිත බැරකම්

ශේෂපත්‍ර දිනට වූ සියළු ද්‍රව්‍යාත්මක ප්‍රාග්ධන **බැඳීම්** වියදම් වෙන්කිරීම් හා **අවිනිශ්චිත** බැරකම් ගිණුම් සටහන් වල දක්වා ඇත.

3.2 වට්ටෝරු භාණ්ඩ / තොග ඇගයුම

තොග පිරිවැයට ඇගයුම් කර ඇත.

4. **ආදායම් හා වියදම්**

4.1 ආදායම්

4.1.1 මණ්ඩලයේ ආදායම් තුල පුද්ගලික වෛද්‍ය සහතික හා රාජ්‍ය පුනරාවර්තන ප්‍රදාන සහ විවිධ ආදායම් සඳහා ගාස්තු ඇතුළත් වේ.

4.1.2 සියළු ආදායම් උපචිත පදනම මත හදුනා ගැනේ.

4.2 වියදම

රෝගී ප්‍රතිකාර ලබා දීමට හා ප්‍රාග්ධන වත්කම් සක්‍රිය ලෙස නඩත්තු කරලීමට අදාල සියළු වියදම් වසරේ අතිරික්තය හෝ හිගය ගණනය කිරීමේ දී උපචිත පදනම මත ආදායමට බැර කර ඇත.

ආදායම් හා වියදම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ දී, වියදම් ක්‍රමයේ ස්වභාවය මගින් අධ්‍යක්ෂක මණ්ඩලයේ කාර්යසාධනයේ මූලිකාංග ප්‍රමාණවත් ව පැහැදිලි වන ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

Final Account For Annual Report

ස්ථාවර වත්කම් ලේඛණය - 2016 දෙසැම්බර් 31 දිනට

(Rs)

අයිතමය	පිරිවැය				අනුපාතය	ක්ෂය				31/12/2016 දිනට ලියාහැරි අගය
	1/1/2016 දිනට	වසරේ එකතුවීම්	වසරේ ඉවත්කිරීම්	31/12/2016 දිනට		1/1/2016 දිනට	වසරේ එකතුවීම්	වසරේ ඉවත්කිරීම	31/12/2016 දිනට	
ඉඩම්	24,980,041.00	1,982,312.50		26,962,353.50		-			-	26,962,353.50
ගොඩනැගිලි & සවිකිරීම්	175,884,765.74	379,294.96		176,264,060.70	2%	29,626,275.96	3,525,281.21		33,151,557.17	143,112,503.53
වාහන	17,958,792.90			17,958,792.90	20%	14,636,788.90	1,886,000.00		16,522,788.90	1,436,004.00
ලීබඩු, සවිකිරීම් & උපකරණ	10,002,903.05	401,199.00		10,404,102.05	10%	7,450,743.48	530,408.96		7,981,152.44	2,422,949.61
යන්ත්‍රෝපකරණ	7,948,704.76	872,972.50		8,821,677.26	15%	5,814,552.16	707,553.04		6,522,105.20	2,299,572.06
පරිඝනක	792,386.00	576,790.40		1,369,176.40	20%	520,678.60	199,727.28		720,405.88	648,770.52
වෛද්‍ය උපකරණ	164,738,024.39	25,686,155.00		190,424,179.39	15%	108,752,486.70	18,490,802.29		127,243,288.99	63,180,890.40
එකතුව	402,305,617.84	29,898,724.36	-	432,204,342.20		166,801,525.80	25,339,772.78	0.00	192,141,298.58	240,063,043.62

240,063,043.62

Pg.6

		2016		2015
මුදල් සහ මුදල් වලට සමාන				
දෑ	01			
බැංකුගත මුදල්		24,223,288.77		13,027,099.19
සුළු මුදල්		9,140.00		-
අතැති මුදල්		139,650.00		19,975.00
		24,372,078.77	-	13,047,074.19
ලැබීමට නියමිත	02			
තැන්පත් ගිණුම		300,000.00		570,000.00
උත්සව අත්තිකාරම්		261,250.00		270,000.00
විශේෂ අත්තිකාරම්		-		-
අත්තිකාරම්		-		-
ආපදා ණය		8,003,679.60		8,125,013.00
		8,564,929.60	-	8,965,013.00
තොග	03			
ලිපිද්‍රව්‍ය		129,240.22		154,042.22
ඖෂධ		16,761,270.48		18,642,050.23
රසායනාගාර රසායනික ද්‍රව්‍ය		519,140.89		579,056.78
රෙදි වර්ග		207,127.18		109,037.07
පොදු තොග		174,805.44		223,272.33
අළුත්වැඩියා & නඩත්තු		202,098.32		65,316.18
එක්ස් රේ		587,533.54		691,690.14
දන්ත		55,003.12		-
		18,636,219.19	-	20,464,464.95

		2016	2015
පූර්ව ගෙවීම්	04		
සේවා ගිවිසුම්-ඩිජිටල් කොපියර්		7,086.88	-
සේවා ගිවිසුම්-මධ්‍යම වායු සමීකරණ		115,898.26	102,890.16
සේවා ගිවිසුම්-විදුලි සෝපානය		65,000.00	152,500.00
සේවා ගිවිසුම්-විෂුවල් ෆීල්ඩ් යන්ත්‍රය		77,700.00	59,725.41
කුලී		-	-
විදුලිය- හෙද නේවාසිකාගාර		-	4,070.48
		265,685.14	319,186.05

ඉදිකිරීම් ප්‍රගතිය	05		
ඉදිකිරීම් ප්‍රගතිය - නව ගොඩනැගිල්ල		662,076.27	180,000.00
		662,076.27	180,000.00

යටිතල පහසුකම්, පිරියත හා උපකරණ	06			
යන්ත්‍රෝපකරණ		2,299,572.06		2,134,152.60
ලී බඩු		2,422,949.61		2,552,159.57
වාහන		1,436,004.00		3,322,004.00
පරිඝනක		648,770.52		271,707.40
වෛද්‍ය උපකරණ		63,180,890.40		55,985,537.69
		69,988,186.59	-	64,265,561.26

		2016		2015
ඉඩම් හා ගොඩනැගිලි	07			
ඉඩම්		26,962,353.50		24,980,041.00
ගොඩනැගිලි සහ සවිකිරීම්		143,112,503.53		146,258,489.78
		170,074,857.03	-	171,238,530.78

උපචිත වියදම්	08		
විගණන ගාස්තු	1,050,000.00		1,450,000.00
TKS finance	10,611.00		-
විදුලි බලය	1,599,703.40		592,359.71
දුරකතන ගාස්තු	65,155.12		20,916.73
ඉන්ධන	168,150.00		69,350.00
ගමන් වියදම්	30,499.00		5,018.00
ඖෂධ තොග	-		93,965.00
වෛද්‍ය උපකරණ	6,886,620.00		197,573.00
වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව	383,369.50		632,522.40
වෛද්‍ය උපකරණ-පාරිභෝජික	555,750.00		723,410.00
රසායන ද්‍රව්‍ය	1,023,225.71		675,123.56
යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා	26,500.00		24,500.00
වෙලඳ දැන්වීම්	126,787.50		86,025.00
Con. සාමාන්‍ය ඖෂධ ගබඩා	-		42,180.00
ජලය	110,975.62		1,620.60
ලිපි ද්‍රව්‍ය	11,821.50		-
පස් සැපයීම	1,000,000.00		-
මුරකරු දීමනා	15,500.00		-
ගෙවීමට ඇති දෑ	-		-
ආපසු ලබා දෙන ටෙන්ඩර් තැන්පත්	300,950.00		170,000.00
රැඳවුම් මුදල	926,902.84		975,452.84
දීමනාව - බාහිර වෛද්‍යවරු	47,000.00		47,000.00
අභ්‍යාසලාභී දීමනාව - කාර්යාල කාර්යමණ්ඩලය	-		-
සිසු හෙද	333,229.54		629,676.82
සිද්ධ පරිපූරක වෛද්‍ය	32,891.00		159,896.78
උප කම්කරු පාරිශ්‍රමික	409,265.82		242,477.93
අතිකාල, අතිරේක තීරුබදු & PH ගෙවීම්	2,127,075.62		1,419,427.19
සුබසාධන සංගමය	6,534.52		5,484.00
	17,248,517.69	-	8,263,979.56

		2016		2015
ණය හිමියෝ	09			
SPC		14,931,735.89		20,407,150.70
MSD		18,881,996.24		8,338,325.90
සීමා. සුපර් විල්ෂයින්		4,209,980.48		5,634,506.16
වාමිං සෙකියුරිටි		-		293,173.20
ෆ්‍රිජ් ඉංජිනියරිං		492,186.68		335,536.72
එරන්දි සප්ලයර්		1,602,371.44		1,800,080.68
නලින් තුෂාර		100,000.00		-
වීරමුන්ඩ		240,206.00		165,000.00
STC		70,986.18		139,018.38
සරත් හාඩ්වෙයා		173,043.00		69,947.00
NERD		-		241,980.00
ධීවර සංස්ථාව		254,667.25		-
එල් ආර් ඩී සී සෙකියුරිටි සර්විසස්		1,374,630.73		-
		42,331,803.89	-	37,424,718.74
සංචිත	10			
පාරිතෝෂිත ප්‍රතිපාදන		22,164,890.64		30,070,612.79
		22,164,890.64	-	30,070,612.79
ප්‍රාග්ධනය සහ සංචිත	11			
විජය කුමාරතුංග අනුස්මරන පදනම		29,632,139.32		29,632,139.32
ආයෝජන මණ්ඩලය		28,155,751.12		28,155,751.12
නාගරික සං.අධිකාරිය		18,000,000.00		18,000,000.00
		75,787,890.44	-	75,787,890.44

රාජ්‍ය ප්‍රදාන- ප්‍රාග්ධන 12

	As at 01/01/2015	Addi. Dur.i the Ye	Amortization	as at 31/12/2016
රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන	167,586,428.14	25,000,000.00	23,903,772.78	168,682,655.36
වාහන - ඩබල් කැබ් රථය WPPC 4087 භාණ්ඩාගාරය මගින්	2,240,000.00			2,240,000.00
ගිලන් රථය - WPLW - 0961 සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්	2,872,000.00		1,436,000.00	1,436,000.00
	172,698,428.14	25,000,000.00	25,339,772.78	172,358,655.36

		2016		2015
රාශිභූත හිඟය	13			
ඉ/ගෙ ශේෂය - 01.01.2013 දිනට		(49,758,280.27)		(30,214,301.93)
කාලසීමාව තුල අතිරික්තය		(3,091,145.89)		(20,023,883.72)
පූර්ව වසරේ ගැලපුම්		1,169,308.40		479,905.38
		(51,680,117.76)	-	(49,758,280.27)
වෙනත් ආදායම්	14			
පුද්ගලික වෛද්‍ය සහතික ගාස්තු		251,150.00		226,850.00
සුළු ආදායම්		692,770.00		170,075.00
ටෙන්ඩර් තැන්පත් - ආපසු නොගෙවන		207,000.00		154,500.00
ආපදා ණය පොලී		340,979.06		350,790.53
අක්ෂි සැත්කම් ගාස්තු - ප්‍රධාන		16,106,500.00		17,366,000.00
අක්ෂි සැත්කම් ගාස්තු - සුළු		272,000.00		191,500.00
සාමාන්‍ය සැත්කම් - ප්‍රධාන		697,000.00		16,000.00
සාමාන්‍ය සැක්තම් - සුළු		318,000.00		95,000.00
පොලී - විශේෂ අත්තිකාරම්		11,987.80		14,491.60
කුලී		-		-
FFA		10,500.00		16,000.00
FLT		117,000.00		127,500.00
Peripheral		110,000.00		32,000.00
LID		1,000.00		2,000.00
YAG PI		34,000.00		45,400.00
PRP		151,900.00		129,150.00
HVF		59,000.00		135,750.00
YAG CAPSULOMY		776,300.00		784,700.00
OCT		2,169,000.00		1,591,000.00
Grid		3,500.00		19,000.00
ආහාර		8,420.00		8,350.00
Endoscopy unit		40,000.00		-
Ultrasound Scan		37,000.00		-
		22,415,006.86	-	21,476,057.13

		2016	2015
වියදම්	15		
පාරිශ්‍රමික, වැටුප් සහ සේවක ප්‍රතිලාභ			
වැටුප් සහ දීමනා			
වැටුප් සහ දීමනා - වෛද්‍ය නිලධාරි		35,474,847.21	30,330,403.56
වැටුප් සහ දීමනා - වෙනත්		7,394,989.78	6,030,249.59
වැටුප් සහ දීමනා - පරිපූරක		9,880,917.49	9,297,197.74
වැටුප් සහ දීමනා - හෙද		41,541,622.70	38,118,956.02
වැටුප් සහදීමනා - සුළු සේවක		34,951,368.56	32,514,885.53
E.P.F. 12%		9,544,375.08	7,437,138.06
E.T.F. 3%		2,386,095.90	1,858,349.39
අතිකාල - වෙනත්		660,814.97	393,756.02
අතිකාල - පරිපූරක වෛද්‍ය		644,693.76	521,898.95
අතිකාල - හෙද		5,988,117.50	6,128,274.19
අතිකාල - සුළු සේවක		4,454,842.25	3,687,748.32
අතිකාල ගෙවීම් වෛද්‍ය නිලධාරි		4,616,346.00	3,487,718.25
පාරිතෝෂිත වියදම්		(6,953,031.77)	8,525,242.14
		150,585,999.43	148,331,817.76

සැපයුම්

	ආරම්භක තොග as at 01.01.2016	2016 මිලදී ගැනීම්	දිනට අවසාන තොගය	වසරේ පාරිබෝජන 2016
රසායනාගාර රසායන ද්‍රව්‍ය	579,056.78	1,703,304.94	519,140.89	1,763,220.83
එක්ස් රේ පටල , රසායන ද්‍රව්‍ය	691,690.14	908,768.50	587,533.54	1,012,925.10
ඖෂධ	18,642,050.23	67,432,276.28	16,761,270.48	69,313,056.03
රෙදි වර්ග	109,037.07	941,500.00	207,127.18	843,409.89
පරිභෝජ්‍ය , පොදු ගබඩා	223,272.33	960,479.44	174,805.44	1,008,946.33
ලිපිද්‍රව්‍ය	154,042.22	573,224.30	129,240.22	598,026.30
අලුත්වැඩියා , නඩත්තු (ii)	65,316.18	434,705.59	202,098.32	297,923.45
දන්ත පාරිබෝජනය		127,079.45	**55,003.12**	72,076.33
වෛද්‍ය උපකරණ				-
නිල ඇඳුම්				-
ගෑස්				-
	20,464,464.95	73,081,338.50	18,636,219.19	**74,909,584.26**

සැපයුම් භාවිතාව 16

	2016	2015
රසායනාගාර රසායනද්‍රව්‍ය	1,763,220.83	1,655,283.17
එක්ස්රේ පටල , රසායනික ද්‍රව්‍ය	1,012,925.10	567,470.49
ඖෂධ	69,313,056.03	62,502,605.83
රෙදි වර්ග	843,409.89	122,478.00
පරිභෝජ්‍ය , පොදු ගබඩා	1,008,946.33	966,272.47
ලිපිද්‍රව්‍ය	598,026.30	478,882.18
අලුත්වැඩියා , නඩත්තු (ii)	297,923.45	437,400.72
දන්ත පාරිබෝජනය	72,076.33	234,140.00
වෛද්‍ය උපකරණ -පරිභෝජ්‍ය	3,862,743.50	2,086,360.00
නිල ඇඳුම්	-	912,624.00
ගෑස්	282,742.00	367,604.00
	79,055,069.76	70,331,120.86

ක්ෂය 17

ගොඩනැගිලි , සවිකිරීම්	3,525,281.21	3,517,695.31
වාහන	1,886,000.00	3,005,999.00
ලී බඩු, සවිකිරීම් , උපකරණ	530,408.96	528,146.66
යන්ත්‍රෝපකරණ	707,553.04	595,892.00
පරිගණක	199,727.28	104,467.20
වෛද්‍ය උපකරණ	18,490,802.29	15,350,312.56
	25,339,772.78	- 23,102,512.73

		2016	2015
ගමන් වියදම්	18		
ගමන් වියදම් , යැපීම් දීමනාව (වෙනත් නිලධාරීන්)		67,529.50	-
ගමන් වියදම්		104,560.00	-
නඩත්තු			
විදුලි		9,551,118.02	7,291,547.98
ජල		1,575,973.97	1,657,634.82
දුරකථන		304,627.77	297,313.28
තැපැල්		22,818.00	17,373.00
අලුත්වැඩියා , නඩත්තු			
අලුත්වැඩියා , නඩත්තු - ගොඩනැගිලි		294,834.00	153,888.66
අලුත්වැඩියා , නඩත්තු - යන්ත්‍රෝපකරන		2,469,568.32	1,227,087.62
අලුත්වැඩියා , නඩත්තු - වාහන		444,589.11	598,001.45
අලුත්වැඩියා , නඩත්තු - පරිගණක		35,679.00	223,300.00
අලුත්වැඩියා , නඩත්තු - වෛද්‍ය උපකරණ		2,114,874.79	1,707,003.99
අලුත්වැඩියා , නඩත්තු - ලී බඩු		56,119.25	12,000.00
කොන්ත්‍රාත්තුමය සේවා			
පිරිසිදු කිරීම්		4,979,554.36	5,634,506.16
රෙදි සේදීම්		853,387.00	660,000.00
ආරක්ෂක		4,025,011.74	3,371,628.55
ආහාර සැපයුම්		5,812,854.41	5,183,876.85
වෙනත්			
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ගාස්තු		132,250.00	63,000.00
සුළු වියදම්		212,265.46	817,229.57
ප්‍රචාරක දැන්වීම්		760,540.65	731,323.50
රක්ෂණ මුදල් , මාර්ගස්ථ			6,095.40
වෙනත් බැංකු ගාස්තු		26,465.00	31,573.00
විගණක ගාස්තුව		250,000.00	400,000.00
නීතිඥ ගාස්තු		24,200.00	-
කුලී		327,574.97	318,153.31
විදුලි ජනක යන්ත්‍ර ඉන්ධන		133,000.00	114,800.00
සංග්‍රහ වියදම්		55,086.00	-
මුරකරු සඳහා ගෙවීම්		183,000.00	-
වාහන වියදම්			
ඉන්ධන		757,568.95	778,675.00
රක්ෂණ		269,613.29	404,373.59
ලියා./ බලපත්‍ර ගාස්තු		20,420.00	31,561.20
		35,865,083.56	31,758,803.68
පරිත්‍යාග ගිණුම			
ශේෂය ඉ/ගෙ	19	1,861,114.53	1,323,877.55
කාලය තුල පරිත්‍යාග		10,359,911.50	537,236.98
		12,221,026.03	1,861,114.53

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. එච්එස්එම්/බී/ඩබ්ලිව්කේඑම්එච්/1/16/18

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2017 සැප්තැම්බර් 12 දින.

සභාපති,

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය.

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ 13(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.80,576,416 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද තාවකාලිකව අක්‍රියවී ඇති, ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගත්වා ඇති හා බැහැර කිරීමට ඇති දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගැනීමට හා සාධාරණ අගය හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9

2016 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.18,636,219 ක් වූ තොගය අගය කිරීම සම්බන්ධයෙන් යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හා භාවිතා කළ පිරිවැය සූත්‍රය හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විධිමත් භෞතික තොග සමීක්ෂණයක් සිදුකර ඉතිරි තොගයේ පිරිවැය තක්සේරු නොකර එදිනට තොග ලේඛනවල දැක්වෙන ඉතිරි තොගයේ පිරිවැය රු.18,636,219 ක් භෞතික තොගයේ පිරිවැය ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. ඉතිරි තොගය භෞතිකව පරීක්ෂා කළ බවට මූල්‍ය ප්‍රකාශනවල සාවද්‍ය සටහනක් යොදා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබුණු Operating Theatre Overhead Lamp නැමැති උපකරණය සැපයීමේ ප්‍රමාද ගාස්තු ලෙස සැපයුම්කරුගෙන් අයකර තිබුණු රු.146,880 ක් එහි පිරිවැය වූ රු.2,448,000 න් අඩුකර ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම වත්කමේ පිරිවැය හා වර්ෂයේ ඌනතාවය රු.146,880 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2016 වර්ෂය තුළදී අක්ෂි කාච 2,703 ක් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අතර එම කාචවල වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී සිදුකර තිබුණු සේවක පාරිතෝෂික අධි ප්‍රතිපාදනය නිවැරදි කිරීමට පාරිතෝෂික ප්‍රතිපාදන ගිණුමට හර කර තිබුණු රු.6,953,032 ක් සමුච්චිත අතිරික්තතා හෝ ඌනතා ගිණුමට බැර නොකර සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන වියදමෙන් අඩුකර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාළ රු.4,951,400 ක් වූ පාරිතෝෂික දීමනා ප්‍රතිපාදනය ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) පහත සඳහන් නිරීක්ෂණ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල තුල්‍යතාවය හා නිවැරදිතාවය සම්බන්ධයෙන් විගණනයේදී ගැටළු සහගත විය.

(i) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු රසායන ද්‍රව්‍ය සඳහා ගෙවිය යුතුව තිබුණු රු.777,872 ක් 2016 දෙසැම්බර් 31 දිනට උපචිත රසායන ද්‍රව්‍ය වියදම් ලෙස ගිණුම්ගත කර තිබියදී, නැවතත් එම වටිනාකම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා ණයහිමි ගිණුමටද බැර කර තිබීම.

(ii) ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය මිලදී ගැනීම් ගිණුමේ නිවැරදි එකතු වටිනාකම රු.67,501,583ක් වුවද, එම වටිනාකම රු.67,432,276 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් රු.69,307 කින් එම වටිනාකම අඩුවෙන් දක්වා තිබීම.

(iii) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා ණයහිමි ලෙජර් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට නිවැරදි ශේෂය රු.14,832,116 ක් වුවද, එම ගිණුමේ ශේෂය රු.14,931,736 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබීම හේතුවෙන් එම ශේෂය රු.99,620 ක් වැඩිපුර දක්වා තිබීම.

(iv) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් වායුසමීකරණ පද්ධතිය නඩත්තු හා සේවා කිරීම සඳහා 2016 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම රු.28,594 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) පහත සඳහන් නිරීක්ෂණ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තුල්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී ගැටළු සහගත විය.

(i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආරම්භක මුදල් හා මුදල් සමාන දැයෙහි වටිනාකමට 2016 ජනවාරි 01 දිනට අතැති මුදල් ශේෂය වූ රු.19,975 ක් එකතු කර නොතිබීම.

(ii) සේවයෙන් ඉවත්වූ සේවකයින් 5 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු පාරිතෝෂික දීමනා රු.952,690 ක් මුදල් ගලායාම් ලෙස දක්වා නොතිබීම.

(iii) පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.689,403 ක් මුදල් ගලාඒම් ලෙස හා මුදල් නොවන සංචලන ලෙස රු.6,922,437 ක් මුදල් ගලායාම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි සාවද්‍ය ලෙස ගැලපීම් කර තිබීම.

2.2.3 පැහැදිළි නොකළ වෙනස්කම්

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, රසායනාගාර ද්‍රව්‍ය තොගවල වටිනාකම රු.519,141 ක් වුවද රසායනාගාර කාර්මිකඥ විසින් ඉදිරිපත් කර තිබුණු වාර්තාව අනුව එදිනට ශේෂය රු.683,591 ක් වූයෙන් එම ශේෂ අතර වෙනස රු.164,450 ක වෙනසක් විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

	විෂයය	වටිනාකම	ඉදිරිපත් නොවූ ලිඛිත සාක්ෂි
		රු.	
(අ)	පරිත්‍යාග භාණ්ඩ	554,069	පරිත්‍යාග භාණ්ඩ වර්ග 11 ක වටිනාකම් තක්සේරු කළ පදනම.
(ආ)	රෝහල පිහිටි ඉඩම	18,000,000	ඉඩමේ ඔප්පුව හෝ බදු ගිවිසුම් ඔප්පුව ආදී වූ අයිතිය තහවුරු කළ හැකි ලියකියවිලි.

2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 702 (3)	රෝහල වෙත සැපයුම් හා සේවාවන් ලබාගැනීම සඳහා මෙන්ම වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී බාහිර පාර්ශවයන් සමඟ එළඹ තිබුණු ගිවිසුම් 10 ක පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 756 (1)	සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2017 අගෝස්තු 01 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3, 2.12, 7.11.1 හා 8.9 ඡේද	සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.17,253,230 ක්වූ වෛද්‍ය උපකරණ 06 ක සැපයුම්කරුවන් සමඟ ලිඛිත ගිවිසුම්වලට එළඹීම සිදුකර නොතිබුණි. තවද එකී මිලදී ගැනීම්වලට අදාළව නියමිත ආකෘතියට අනුව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා පිළියෙල කිරීම, එම කමිටුවල සාමාජිකයින්ගෙන් ලබාගත යුතු ප්‍රතිඥාවන් ලබාගැනීම හා ලංසු ඇගයීම් වාර්තා පිළියෙල කිරීමද සිදුකර නොතිබුණි.

(ඇ) ඖෂධ කළමනාකරණ අත්පොත

(i) 3 පරිච්ඡේදයේ 4 (ඇ) ඡේදය	ඖෂධ සමාලෝචන කමිටුවක් රෝහල තුළ ස්ථාපිත කර නොතිබුණි.
(ii) 5 පරිච්ඡේදයේ 2 ඡේදය	ඖෂධ ගබඩාව තුළ අවම තොග මට්ටම්, උපරිම තොග මට්ටම්, යළි ඇණවුම් මට්ටම හා ආරක්ෂිත තොග මට්ටම් පවත්වා නොතිබුණි.
(iii) 5 පරිච්ඡේදයේ 3 හා 4 ඡේද	කල් ඉකුත්වීම හෝ තත්ත්වයෙන් බාලවීම හේතුවෙන් වෛද්‍ය සැපයුම් අංශය වෙත ආපසු යවන ඖෂධ පිළිබඳ කාර්තුමය වාර්තා වර්ෂ ගණනාවක සිට පිළියෙල කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආරෝග්‍යශාලා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.3,091,146 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.20,023,887 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,932,741 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.17,321,667 කින් වැඩිවී තිබුණද රාජ්‍ය ප්‍රදාන රු.31,000,000 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,646,870 ක අතිරික්තයක් වුවද 2013 වර්ෂය වන විට එය රු.20,378,939 ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. නැවතත් 2014 වර්ෂයේදී එය රු.3,558,018 ක අතිරික්තයක් බවට පත්වී තිබුණද 2015 හා 2016 වර්ෂ වලදී පිළිවෙළින් රු.20,023,884ක සහ රු.3,091,146 ක ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.85,133,363 ක්වූ මණ්ඩලයේ දායකත්වය සියයට 10 සිට සියයට 59 දක්වා වූ උච්චාවචනයන් සහිතව 2016 වර්ෂයේදී රු.151,492,373 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පනත ප්‍රකාරව මෙම මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සහ රෝගී තැනැත්තන් රැකබලාගනු ලබන ආයතනයක් වශයෙන් එය කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම මණ්ඩලයේ කර්තව්‍ය විය. එම කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී X - ray ද්‍රව්‍ය සඳහා දරන ලද වියදම රු.138,425 කින් වැඩිවී තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ වියදමට සාපේක්ෂව සියයට 24.4 කින් වැඩිවීමක් විය. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද X - ray පරීක්ෂණ සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 0.49 කින් අඩුවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලිනන් ද්‍රව්‍ය (Linen Items) සඳහා වියදම සියයට 589 කින් වැඩිවී තිබුණු නමුත් නේවාසිකව ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව වැඩිවීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 2.9ක් පමණක් විය.

(ඇ) 2015 පෙබරවාරි මාසයේදී ඉදිකිරීම් නිමකර තිබූ ඉදිකිරීම් වටිනාකම රු.13,369,729 ක් වූ තුන් මහල් ගොඩනැගිල්ල තුළ Laboratory, Chronic Ulcer Care Unit, Utility Rooms හා Wound Care Unit යන අංශ ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබුණද 2017 මැයි 31 දින වන විටත් එම අංශ ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කර නොතිබුණි. මෙම ගොඩනැගිල්ලේ බිම් මහල තුළ වාට්ටු අංක 06 ස්ථාපිත කර තිබුණු නමුත්, එය වාට්ටුවකට සුදුසු අයුරින් ඉදිකළ ගොඩනැගිල්ලක් නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) වැඩි පරීක්ෂණ වර්ග ප්‍රමාණයකින් වැඩි පරීක්ෂණ සංඛ්‍යාවක් සිදුකළ හැකි වන පරිදි සමාලෝචිත වර්ෂය තුළදී රසායනාගාර පහසුකම් වැඩි කිරීමට සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සැලසුම් කළ පරිදි කටයුතු සිදුකර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.10,120,000 ක් වටිනා එන්ඩොස්කොපි යන්ත්‍රයේ (Endoscopy Machine) පිරිවිතර, නඩත්තු සේවා ගිවිසුම, ලැබුණු අමතර කොටස්, උපාංග ආදිය පිළිබඳ හඳුනාගැනීමකින් තොරව භාරගෙන තිබුණු අතර යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව ජීව වෛද්‍ය ඉංජිනේරුවරයෙකුගේ සහතිකයක් ලබාගෙන නොතිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළදී රෝහලේ අවශ්‍යතා සඳහා රු.71,112,929 ක ඖෂධ, රසායනාගාර ද්‍රව්‍ය, විකිරණ ද්‍රව්‍ය, ශල්‍ය ද්‍රව්‍ය හා සැරහුම් ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. මෙම ද්‍රව්‍ය මිලදී ගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා තොග පාලනය පිළිබඳව පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(අ) ඉහත සඳහන් ද්‍රව්‍ය සම්බන්ධයෙන් රෝහලේ සමස්ත වාර්ෂික අවශ්‍යතාවය හඳුනානොගෙන, ද්‍රව්‍ය සඳහා දරන ලද මුළු වියදමෙන් සියයට 27 ක් වෛද්‍ය සැපයුම් අංශය වෙතින් මිලදීගත් ද්‍රව්‍ය සඳහා පමණක් ඇස්තමේන්තු කර තිබුණි. තවද වෛද්‍ය සැපයුම් අංශය වෙතින් වර්ෂය තුළදී මිලදී ගැනීමට ඇස්තමේන්තු නොකරන ලද ද්‍රව්‍ය වර්ග 374 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මගින් මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා රු.40,366,867 ක් වැයකර තිබුණි.

(ආ) ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 32 ක තොග වෛද්‍ය සැපයුම් අංශය සතුව තිබියදී එම අංශයෙන් මිලදී නොගෙන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීම සඳහා රු.2,772,991 ක් වැඩියෙන් වැයකර තිබුණි.

(ඇ) ඖෂධ කළමනාකරණ අත්පොතේ 10 පරිච්ඡේදයේ 14 වගන්තිය ප්‍රකාරව ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය හා උපකරණ මෙන්ම රසායන ද්‍රව්‍ය ගබඩා භාර නිලධාරීන් විසින් වර්ෂය අවසානයේ තොග ලේඛන තුලනයකර ශේෂ කළ යුතු වුවත්, 2016 වාර්ෂික තොග

සමීක්ෂණය සඳහා එලෙස තොග ලේඛන ශේෂකර ඉදිරිපත් කර නොතිබුණි. භෞතික තොග සමීක්ෂණය නියැදි පරීක්ෂණයක් මගින් පමණක් සිදුකර පොත් ශේෂය භෞතික තොග සමීක්ෂණ ශේෂය ලෙස ගිණුම්ගත කර තිබුණු බව තහවුරු විය. එමෙන්ම රෝහලේ වාට්ටු හා ශල්‍යාගාර මෙන්ම බාහිර රෝගී අංශයේ බෙහෙත් කවුළු වෙත නිකුත්කර ඉතිරිව තිබුණු ද්‍රව්‍ය සමීක්ෂණය කර නොතිබුණි.

(ඇ) ද්‍රව්‍ය ලැබීම් හා නිකුත් කිරීම් සටහන් කිරීම හා තොග ලේඛන තුලනය කිරීම නිවැරදිව සිදුනොකිරීම හේතුවෙන් තොග ලේඛනවල ඇතැම් අයිතමයන්ට අදාළව සෘණ ශේෂයන් උද්ගතවී පැවතුණි. එම ශේෂ තුලනය කිරීම සඳහා අවිධිමත් ආකාරයෙන් තොග ලේඛනවලට අමතර සංඛ්‍යා සටහන් ඇතුළත් කර තිබුණු අතර 2016 වර්ෂයේදී ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 35 කට අදාළව ඒකක 83,350 ක් එලෙස ඇතුළත් කර තිබුණි.

(ඉ) අවස්ථා බොහෝමයකදී ද්‍රව්‍ය ලැබීම් මෙන්ම නිකුත් කිරීම් පැන්සල් ඉරකින් අවිධිමත් ආකාරයෙන් කපාහැර තිබුණු බව නිරීක්ෂණය වූ අතර අදාළ නිලධාරියා වූ ප්‍රධාන ඖෂධවේදී විසින් සිය අත්සන යොදා එය සහතික කර නොතිබුණි. පිරිවැය රු.1,386,649 ක් වූ ඖෂධ වර්ග 15 ක ලැබීම් සටහන්ද, පිරිවැය රු.691,517 ක් වූ ඖෂධ වර්ග 68 ක නිකුත් කිරීම් සටහන්ද එලෙස කපාහැර තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ රෝහල විසින් අක්ෂි ශල්‍යකර්ම 10,910 ක් සිදුකර තිබුණි. පරිත්‍යාග ලෙස ලැබී තිබු අක්ෂි කාච 2,703 කින් 2,346 ක් හා අක්ෂි ශල්‍ය උපකරණ හා ඖෂධ වර්ග ඒකක 7,066 කින් ඒකක 6,112 ක් ශල්‍යකර්ම සඳහා භාවිතා කර තිබුණි. කෙසේ වෙතත් පරිත්‍යාග ලෙස ලැබෙන අක්ෂි කාච, ශල්‍ය උපකරණ හා ඖෂධ වර්ග විධිමත් පරිදි ඉන්වෙන්ට්‍රි ගතකර ශල්‍යාගාරය වෙත නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. තවද වර්ෂය තුළදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අක්ෂි කාච ප්‍රමාණය 2,703 ක් බව ලේඛන ගතකර තිබුණු නමුත් ඉන් අක්ෂි කාච 2,133 කට අදාළ මූලාශ්‍ර ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු බැවින් පරිත්‍යාග ලෙස ලැබුණු අක්ෂිකාච ප්‍රමාණයේ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

(ඉ) වර්ෂය ආරම්භයේ ප්‍රමාණවත් තොග ඉතිරිව තිබියදී වාර්ෂික පරිභෝජනය පිළිබඳ සලකා බැලීමකින් තොරව රු.318,610 ක් වටිනා X - Ray ද්‍රව්‍ය වර්ග 2ක ඒකක 4,000ක තොගයක් සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු අතර එම මුළු ප්‍රමාණයම භාවිතයට නොගෙන ඉතිරිව පැවතුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රෝහලේ අවශ්‍යතාවයට වඩා වැඩි ධාරිතාවයෙන් යුත් යන්ත්‍ර දෙකක් 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍ර දෙක ඌන උපයෝජිතව පැවතුණි. විස්තර පහතින් දැක්වේ.

(i) 2013 වර්ෂයේදී රු.2,500,000 ක් වැය කරමින් මිලදීගෙන තිබුණු Fully Automated Hematology Analyzer යන්ත්‍රයේ උපරිම ධාරිතාවය පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 60 ක් විය. එහෙත් ඉකුත් වර්ෂයේදී පැයකට පරීක්ෂණ ඒකක 17 ක් වශයෙන් සිදුකර තිබුණු මුළු පරීක්ෂණ සංඛ්‍යාව 24,452ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී පැයකට පරීක්ෂණ ඒකක 9 ක් වශයෙන් සිදුකර තිබුණු මුළු පරීක්ෂණ සංඛ්‍යාව 12,984 ක් පමණක් විය.

(ii) 2013 වර්ෂයේදී රු.8,736,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු Fully Automated Biochemistry Analyzer යන්ත්‍රය මගින් විවිධ පරීක්ෂණ වර්ග 21 ක් පමණ කළ හැකිව තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂණ වර්ග 12 ක් පමණක් සිදුකර තිබුණි. තවද මෙම යන්ත්‍රයේ උපරිම ධාරිතාවය පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 300 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී පැයකට පරීක්ෂණ ඒකක 25 ක් පමණක් සිදුකර තිබුණි.

(ආ) 2000 වර්ෂයේදී රු.765,000 ක් වැයකර මිලදීගෙන තිබුණු අක්ෂි ශල්‍යකර්ම සඳහා භාවිතයට ගන්නා Operating Microscope උපකරණය වර්ෂ 7 කට වැඩි කාලයක සිට භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2010 වර්ෂයේදී රු.11,532,317 ක් වැයකර මිලදී ගෙන තිබුණු ලැපරොස්කොපි යන්ත්‍රය මගින් එම වර්ෂයේදී එක් පරීක්ෂණයක් පමණක් සිදුකර තිබුණි. 2011 සිට 2015 සැප්තැම්බර් දක්වා එම යන්ත්‍රය මුළුමනින්ම නිෂ්කාර්යව පැවති අතර,

විජය කුමාරතුංග රෝහලේ ශල්‍ය අංශය ස්ථාපිත කිරීමෙන් පසු 2016 ජුනි සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී ශල්‍යකර්ම/පරීක්ෂණ 34 ක්ද, 2017 ජනවාරි සිට මාර්තු දක්වා කාලය තුළදී ශල්‍යකර්ම/පරීක්ෂණ 15 ක්ද සිදුකර තිබුණි. මෙය අධික ධාරිතාවයකින් යුත් යන්ත්‍රයක් වුවද ඇතැම් මාසවල ශල්‍යකර්ම/පරීක්ෂණ එකක් හෝ දෙකක් පමණක් සිදුකර තිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සේවයෙන් ඉවත්වූ සේවකයින් දෙදෙනෙකු වෙත රු.163,436 ක් පාරිතෝෂික වැඩියෙන් ගෙවා තිබුණි. තවද, රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය පසු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ සේවකයින් ඉවත්වීමේදී පාරිතෝෂික දීමනා ගෙවිය නොහැකි වුවත්, එවැනි සේවකයින් දෙදෙනෙකු වෙත රු.136,500 ක පාරිතෝෂික දීමනා ගෙවා තිබුණි.

4.6 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් වටිනාකම රු.12,431,157 ක්වූ රසායනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය පවරා තිබුණු කොන්ත්‍රාත්කරුගෙන් දින 112 ක ප්‍රමාද කාලය වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව රු.672,000 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි. විගණනයේදී සිදුකල භෞතික පරීක්ෂාවට අනුව ඉදිකිරීම් නිසි ප්‍රමිතියට සිදුවී නොතිබුණු බවත්, කොන්ත්‍රාත්තුවේ උපදේශක විසින් නිසි අධීක්ෂණයක් හා සුපරීක්ෂණයක් සිදුකර නොතිබුණු බවත් තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) රෝහලේ පිටුපස බිම් කොටසට පස් කියුබ් 250 ක් පුරවා ගොඩ කිරීමේ කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.1,000,000 ක් වූ අතර ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව නියමිත ප්‍රමාණයෙන් පස් සපයා අතුරා ඇති බවට කාර්මික නිලධාරී හෝ ඉංජිනේරුවරයෙකු හෝ කරන ලද සහතිකයකින් පසු ගෙවීම් සිදුකළ යුතු වුවත් එවැනි සහතිකයකින් තොරව සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය ප්‍රකාරව බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු නමුත් බඳවා ගැනීමේ පරිපාටි පිළියෙල කර නොතිබුණි.

(ආ) ලියාපදිංචි වෛද්‍ය නිලධාරී අනුමත තනතුරු සංඛ්‍යාව 02 ක් වුවද, තථ්‍ය සංඛ්‍යාව 03ක් වූයෙන් වර්ෂ කිහිපයකට පෙර සිටම පවතින මෙම අතිරික්ත තනතුර සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද අනුමත හෙද සොයුරිය තනතුරු 02 ක් වුවද, තථ්‍ය සංඛ්‍යාව 01 ක් පමණක් වූ අතර අනුමත පෝෂණවේදී තනතුර සඳහා බඳවාගැනීම් සිදුකර නොතිබුණි.

(ඇ) අනුමත වෛද්‍ය රසායනාගාර කාර්මිකඥ තනතුරු සංඛ්‍යාව 5 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 3 ක් වූ බැවින් රසායනාගාරයේ පවතින අධි ධාරිතාවයෙන් යුත් රසායනාගාර උපකරණවලින් ප්‍රමාණවත් සේවාවක් ලබා ගැනීමට නොහැකිවී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2016 වර්ෂයේ සිට 2020 වර්ෂය අතර කාලසීමාවට අදාළව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් එය 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාළ ක්‍රියාකාරකම් ඊට ඇතුළත් කර නොතිබුණු අතර වාර්ෂික කාර්යසාධන වාර්තාද පිළියෙල කර නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

විෂයයන් 5 කට අදාළ අයවැයගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 55 සිට සියයට 6,870 දක්වා විචලනයන් පැවතීම, විෂයයන් 9 කට අදාළ අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 25 සිට සියයට 2,085 දක්වා විචලනයන් පැවතීම හා වැය විෂයයන් 5 ක් සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමෙන් තොරව රු.680,538 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබීම ආදී වූ හේතූන් මත අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) කොන්ත්‍රාත් පාලනය	ගිවිසුම් කොන්දේසි අනුව ඉදිකිරීම් කොන්ත්‍රාත් කාර්යයන් ඉටුකරවා ගත හැකි වන ලෙස මනා අධීක්ෂණයක් සිදුකර නොතිබීම හා උපරිම කාර්ය සාධනයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබීම.
(ආ) ඖෂධ තොග පාලනය	(i) තොග අවශ්‍යතාවය හඳුනාගැනීමේ සිට තොග ලැබීම් හා නිකුත් කිරීම් ලේඛනගත කිරීම සහ ගිණුම්ගත කිරීම දක්වා ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් හා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම හා භෞතික තොග සමීක්ෂණ කටයුතු විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබීම.

(ii) තොග ගබඩාව භාරව ක්‍රියා කිරීම හා තොග පාලනය සම්බන්ධ සියලුම කටයුතු එක් නිලධාරියෙකු වෙත පවරා තිබීම.

(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය — චක්‍රලේඛ උපදෙස්, රෙගුලාසි හා විධිවිධාන අනුව කටයුතු නොකිරීම.

(ඇ) ගිණුම්කරණය — ලෙජර් ගිණුම් නිසි පරිදි පවත්වා තුලනය කිරීමට කටයුතු නොකිරීම, ජ'නල් සටහන් භාවිතයෙන් ගැලපීම් සිදුනොකිරීම හා ඖෂධ තොග පාලන ගිණුම් පවත්වා නොතිබීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.